# දෙවන සැසිය

# ජාතික සහ පළාත් අයවැය

All Rights Reserved © 2023
Verité Research

## සාකච්ඡා කරන ක්ෂේත්‍ර

1. ජාතික අයවැය චක්‍රය
2. පළාත් අයවැය
3. නීතිමය රාමුව පිළිබඳ විශ්ලේෂණය
4. අරමුදල් සැපයීමේ ප්‍රධාන මාර්ග
5. අයවැය සම්බන්ධයෙන් තෝරාගත් ගැටලු

All Rights Reserved © 2023
Verité Research

# ජාතික/මධ්‍යම රජයේ අයවැය චක්‍රය

All Rights Reserved © 2023
Verité Research


# රජයේ අයවැය

**රජයේ අයවැය යනු කුමක්ද?**

- එය රජය විසින් සිදු කරනු ලබන මූලික රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහ අධීක්ෂණ යාන්ත්‍රණය වේ.
- අයවැය සම්පාදනය කරනු ලබන්නේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සමඟ උපදේශන මගින්, රාජ්‍ය ආයතන  සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගැනීමෙනි. එහි අරමුණ රජය විසින් නියම කර ඇති මූල්‍ය ඉලක්ක සහ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමයි.

All Rights Reserved © 2023

# ශ්‍රී ලංකාවේ අයවැය චක්‍රය




ජාතික විගණන කාර්යාලය විසින් සියලුම රාජ්‍ය අධිකාරීන්ගේ ගිණුම් විගණනය කරනු ඇත.

පාර්ලිමේන්තු කාරක සභා විසින් වාර්ෂික වාර්තා මහජනතාවට නිකුත් කිරීමට පෙර මූල්‍ය ලේඛන සහ බාහිර විගණන තක්සේරු කරනු ඇත.

**ජූලි මැද**

ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) විසින් මූල්‍ය වර්ෂය සඳහා සාර්ව මූල්‍ය රාමුව සකස් කරන අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් සභා වෙත අයවැය කැඳවීම නිකුත් කරයි.

**ජූලි අග**

රාජ්‍ය ආයතන (SA) විසින් වර්ෂය සඳහා මූල්‍ය සැලසුම් ඉදිරිපත් කළ යුතුය.

**අගෝ - සැප්**

වියදම් යෝජනා අවසන් කිරීමට සහ විසර්ජන පනත කෙටුම්පත් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) රාජ්‍ය ආයතන (SA) සමඟ සාකච්ඡා කරයි.

**ඔක් මුල**

විසර්ජන පනත් කෙටුම්පතේ පළමු කියවීම, කැබිනට් මණ්ඩලය අනුමත කර පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සිදු කෙරේ.

**නොවැ මුල-මැද**

මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන අයවැය කතාව සමඟ විසර්ජන පනත් කෙටුම්පතේ දෙවන වර කියවීම සිදු කෙරේ.

**නොවැ මැද - දෙසැ**

තෙවන වර කියවීම, කාරක සභා අවස්ථා වාද විවාද පැවැත්වීම සහ පාර්ලිමේන්තුව අයවැයට ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේදී සිදු කෙරේ.


**ජන - දෙසැ**

මෙම කාල සීමාව තුළ අයවැය ක්‍රියාත්මක කිරීම සිදුවේ.

මූලාශ්‍රය: 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, “රජයේ පනත්” (දින සඳහන් නොකළ). ලබාගත්තේ: https://www.parliament.lk/how-parliament-works/government-bills.
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රියා පටිපාටි (2002).

All Rights Reserved © 2023
Verité Research

# අදියර 01: අයවැය සම්පාදන ක්‍රියාවලිය




වගකිවයුතු පාර්ශවය: රජයේ විධායක ශාඛාව

කාල පරිච්ඡේදය: පෙර මුදල් වර්ෂයේ අප්‍රේල් - නොවැම්බර්

Source: UNICEF Budget Brief (2019) and Budget Allocation Criteria Report (work-in-progress)

All Rights Reserved © 2023
Verité Research

# අදියර 02: අයවැය අනුමත කිරීමේ ක්‍රියාවලිය

**සැප්තැම්බර් අග**

විසර්ජන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබාගත යුතුය.

**ඔක්තෝම්බර් මුල**

පළමු වර කියවීම

විසර්ජන පනත් කෙටුම්පත සභාගත කෙරේ.

**නොවැම්බර් මුල-මැද**

දෙවනවර කියවීම

අයවැය කතාව සහ ඇස්තමේන්තු

පාර්ලිමේන්තු විවාද (උපරිම දින 7)

පාර්ලිමේන්තු ඡන්දය

**නොවැම්බර් මැද දෙසැම්බර්**

තුන්වන කියවීම

කාරක සභා අවස්ථා විවාද (උපරිම දින 22)

පාර්ලිමේන්තු ඡන්දය

**දෙසැම්බර්**

ජාතික අයවැය අනුමත කෙරේ.

විසර්ජන පනත් කෙටුම්පත සහ අයවැය කතාවේ සියලුම වැඩසටහන් අඩංගු වේ.

වගකිවයුතු පාර්ශවය: රජයේ ව්‍යවස්ථාදායක ශාඛාව - පාර්ලිමේන්තුව

කාල පරිච්ඡේදය : පෙර මුදල් වර්ෂයේ සැප්තැම්බර්-දෙසැම්බර්


මූලාශ්‍රය: යුනිසෙෆ් අයවැය සංක්ෂිප්තය (2019) සහ අයවැය ප්‍රතිපාදන නිර්ණායක වාර්තාව (සම්පාදනය වෙමින් පවතී)

All Rights Reserved © 2023
Verité Research

# අදියර 03: අයවැය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

වගකිවයුතු පාර්ශව: මුදල් අමාත්‍යාංශය, ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD), රාජ්‍ය ආයතන (SAs), භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව (TOD)

කාල පරිච්ඡේදය: අයවැය වසරේ ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා




ප්‍රතිඥා භාරය: නිශ්චිත දිනයකින් ලබන්නාට ගෙවීමට ලිඛිත නියෝගයක්.

KPI: ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) මගින් ප්‍රධාන අරමුණු කෙතරම් කාර්යක්ෂමව සපුරාලන්නේද යන්න පෙන්නුම් කරයි.

මුදල් ප්‍රවාහය: මුදල් සංචලනයට අදාළ ගලා ඒම් සහ පිටතට ගලා යාමේ බිඳවැටීම.

අග්‍රිම: වියදම් කිරීමේ අරමුණු සඳහා භාවිතා කළ යුතු ණය සහ අරමුදල්වල අත්තිකාරමක්.

All Rights Reserved © 2023
Verité Research

# අයවැය අධීක්ෂණය: ප්‍රධාන රාජ්‍ය ආයතන සහ වගකීම්

## විධායක ශාඛාව

### අභ්‍යන්තර විගණන ඒකක (IAUs)

සෑම රාජ්‍ය ආයතනයකටම (SA) ආයතනයේ මූල්‍ය සහ මෙහෙයුම් ඒකකවලින් ස්වාධීනව ක්‍රියාත්මක වන අ.වි.ඒ (IAU) ඇත.

### ජාතික විගණන කාර්යාලය

රජයේ සෑම තරාතිරමකම රාජ්‍ය අංශයේ ආයතන විගණනය කිරීම ජා.වි.කා වෙත පැවරී ඇත.

### ජාතික අයවැය දෙපාර්තමේන්තුව

### ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

## ව්‍යවස්ථාදායක ශාඛාව

### රාජ්‍ය මූල්‍ය පිළිබඳ කමිටුව (COPF)

1. අයවැය ගැටලු සහ මූල්‍ය තීරණ තක්සේරු කිරීම සඳහා මුදල් වර්ෂය තුළ නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය ලේඛන ඇගයීම.
2. ව්‍යවස්ථාදායක අධීක්‍ෂණයේ හිඩැස් පිරවීම.

### පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

1.සියලුම රාජ්‍ය සංස්ථා, රජය සතු ව්‍යවසාය, භාර අරමුදල් සහ විශේෂ ව්‍යවස්ථාපිත අරමුදල් අධීක්ෂණය කිරීම.

2. පූර්ව-පසු සමාලෝචනය

### පොදු ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)

1. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අධීක්ෂණය


2 . පූර්ව-පසු සමාලෝචනය

All Rights Reserved © 2023
Verité Research

# පළාත් අයවැය චක්‍රය

All Rights Reserved © 2023
Verité Research

# පළාත් අයවැය චක්‍රය




### ms<sfhල lsÍu

m<d;a fomd¾;fïka;= m%OdkSka wfm%a,a yd uehs ld,fha§ wdodhï$úhoï ms<sfhල lrk w;r ksfhdacH m%Odk f,alï úiska tajd ii|d ïïnkaO flfrkq ,efí'

### wNHka;r iudf,dapkh yd wkque;sh

m%Odk$ksfhdacH m%Odk f,alïjreka yd m%Odk wud;Hjreka úiska tu weia;fïka;=" .; jQ jirj, i;H jákdlïj,g idfmaClj úuid n,kq ,efí' m<d;a iNd idudðlhka yd fomd¾;fïka;= m%OdkSka úiska bÈßm;a lrkq ,efnk fhdackd i,ld n,d m<d;a iNdfõ ie,iqï wOHCI fj; fhduq flf¾' msßjeh weia;fïka;= ïïmQ¾K lsÍfuka miqj tajd m<d;a iNd wdfhdack jevigykg we;=<;a fldg m%Odk wud;Hjrhd$jßh úiska wkqu; lrkq ,efí'

### uQ,H fldñifï iudf,dapkh

ksfhdacH m%Odk f,alï úiska flgqïm;a lr we;s weia;fïka;= uQ,H fldñiu fj; cQks$cQ,s ld,fha§ hjhs' fldñiu úiska wod< idlÉPd i|yd m<d;a iNdj, fcHIaG idudðlhka yd m%Odk f,alï le|jkq ,efí'

### NdKavd.drh iu. l;sld lsrSu

m<d;a iNdj,g fjka lr we;s whjeh fldgi ms<sn|j l;sld lsÍu i|yd uQ,H fldñiu" cd;sl whjeh fomd¾;fïka;=fõ wOHCI ckrd,a ^uqo,a wud;HxYh& uqK .efia'

### ks¾foaY

uQ,H fldñiu úiska ;djld,sl uqo,a fjkalsÍï ms<sn|j m<d;a iNdj,go" ks¾foaYhka uqo,a wud;Hjrhd iy ckdêm;sjrhd fj;o oekqï foa'

### wjika bÈßm;a lsÍu

flgqïm;a l< uq,a weia;fïka;=j,g ixfYdaOk isÿ lsÍfuka miqj" wdKavqldrjrhd$jßh úiska m<d;a iNdj, uyd iNd /iaùfï§ jd¾Isl uQ,H ;;a;aj m%ldYkh bÈßm;a lrkq ,efí'



Verité Research

© Verité Research 2021, fuhg m%fõY úh yelafla idudðlhkag muKs' lreKdlr wka wh iu. fnod fkd.kak'

## පළාත් අයවැය චක්‍රයේ ක්‍රියාවලිය : පළාත් අයවැය සම්පාදන ක්‍රියාවලියේ මූලික පියවර පහත දැක්වේ

| | |
|---|---|
| පියවර 1<br>ජනවාරි – පෙබරවාරි | මුදල් කොමිෂන් සභාව (FC) මගින් පළාත් සභාවල පුනරාවර්තන සහ මූලධන අවශ්‍යතා හඳුනාගැනීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම. |
| පියවර 2<br>අප්‍රේල් – මැයි | පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් විසින් ගොනු කරන ලද ආදායම්/වියදම් ඇස්තමේන්තු සකස් කිරීම. |
| පියවර 3<br>මැයි – ජූනි | ප්‍රධාන/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සහ ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඇස්තමේන්තු අභ්‍යන්තර සමාලෝචනයට ලක්කිරීම සහ අනුමැතිය ලබාදීම. |
| පියවර 4<br>ජූනි – ජූලි | මුදල් කොමිෂන් සභාව (FC) මගින් පළාත් සභා කාර්‍යමණ්ඩලයේ උපදේශනය මත වාර්ෂික අවශ්‍යතා ඇගයීම සමාලෝචනයට ලක්කිරීම සහ තහවුරු කිරීම. |
| පියවර 5<br>අගෝස්තු – සැප්තැම්බර් | මුදල් කොමිෂන් සභාව (FC) මගින් පළාත් පුනරාවර්තන සහ මූලධන වියදම් අවශ්‍යතා වලට අදාල නිර්දේශ ජනාධිපතිවරයාට සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) ඉදිරිපත් කිරීම. |
| පියවර 6<br>සැප්තැම්බර් –<br>ඔක්තෝබර් | මුදල් කොමිෂන් සභාව (FC) සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) අතර පැවැත්වෙන සාකච්ඡා වලින් අනතුරුව අවසන් ප්‍රතිපාදන විසර්ජන පනතට ඇතුලත් කිරීම. |
| පියවර 7<br>නොවැම්බර් | මුදල් කොමිෂන් සභාව (FC) විසින් මුදල් අමාත්‍යාංශය සහ ජනාධිපතිවරයා නිර්දේශ කල අවසන් ප්‍රතිපාදන පිළිබඳව පළාත් සභා දැනුවත් කිරීම. |
| පියවර 8<br>දෙසැම්බර් | රජයේ අයවැය පාර්ලිමේන්තුවෙන් අනුමත වූ පසු, මුදල් කොමිෂන් සභාව (FC) විසින් ප්‍රධාන අමාත්‍යවරුන් සහ අනෙකුත් පළාත් මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ගේ නිර්දේශ අනුව ප්‍රතිපාදන පළාත් අතර සහ පළාත් තුල ඇති අංශ අතර බෙදාදීම. |
| පියවර 9<br>දෙසැම්බර් | සෑම පළාතකම ප්‍රධාන අමාත්‍යවරයා - පළාත් මට්ටමේ මූල්‍ය කටයුතු භාර අමාත්‍යවරයා ලෙස - අවසන් පළාත් අයවැය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම. ඉන් පසුව, ආණ්ඩුකාරවරයා විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශය ඉන් පසුව, ආණ්ඩුකාරවරයා විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශය පළාත් සභාවට ඉදිරිපත් කිරීම. |

Source : UNICEF, Sri Lanka. Budget Brief: Cycle and Process. Sri Lanka. 2019 | Key Informant Interviews with Senior Officials relevant to the budget cycle process

All Rights Reserved © 2023
Verité Research

# අයවැය චක්‍රයට සම්බන්ධ ප්‍රධාන ආයතන

All Rights Reserved © 2023
Verité Research

**ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD)**

අයවැය ප්‍රතිපාදන ක්‍රියාවලියේ ප්‍රධාන නියෝජිතායතනයයි.අයවැය සම්පාදනයේදී සහ පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ජාතික අයවැයේ අවසාන ප්‍රතිපාදන තීරණ ගැනීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD)**

රාජ්‍ය ආයතන (SAs) විසින් යෝජනා කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘති අනුමත කිරීම සහ රජයේ මධ්‍ය කාලීන රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) සකස් කිරීමේ වගකීම දරයි.

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD)**

බාහිර අරමුදල් සම්බන්ධීකරණය, සාකච්ඡා සහ බලමුලු ගැන්වීම සහ මෙම අරමුදල් ජාතික අයවැය හරහා යොමු කිරීම සහතික කිරීමේ වගකීම දරයි. ණය කළමනාකරණ පද්ධතියක් හරහා රජයේ ණය කළඹක් පවත්වාගෙන යාම මගින් රජයේ බාහිර ණය කළමනාකරණය කරයි.

**මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (FPD)**

ජාතික මට්ටමේ සමස්ත වියදම් සහ ආදායම් සීමාවන් පෙන්නුම් කරන වැදගත් ලියවිල්ලක් වන රජයේ මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුව (MTMFF) සැකසීමේ වගකීම දරයි.

මූලාශ්‍රය: මුදල් අමා., පළාත් සභා නිලධාරීන් සහ රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සමඟ ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා ආසියානු සංවර්ධන බැංකුව. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති. 2018. | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය. 2011. මාර්ගෝපදේශයක්: අයවැය ක්‍රියාවලිය. කොළඹ | යුනිසෙෆ් අයවැය සංක්ෂිප්තය: අයවැය චක්‍රය සහ ක්‍රියාවලි. 2019


All Rights Reserved © 2023
Verité Research

| | |
|---|---|
| **මුදල් කොමිෂන් සභාව (FC)** | මධ්‍යම රජය සහ පළාත් සභා අතර සාකච්ඡා කරන්නාගේ භූමිකාව ඉටු කරන අතර දෙපාර්ශවය අතර ගනුදෙනු සඳහා පහසුකම් සපයයි. |
| **පළාත් සභා භාර අමාත්‍යාංශය** | දැනට පළාත් සභා භාර අමාත්‍යාංශය වන්නේ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයයි (MLGPC)<br>විදේශ අරමුදල් ව්‍යාපෘති සඳහා විශේෂයෙන් රජය සහ පළාත් සභා අතර සම්බන්ධීකාරක ලෙස අමාත්‍යාංශය ක්‍රියා කරයි.<br>පළාත් සභාවලට ඍජුවම විදේශ අරමුදල් ලබා ගත නොහැකි බැවින්, පළාත් සභා විසින් ක්‍රියාත්මක කරන පරිත්‍යාගශීලීන්ගේ අරමුදල් සහිත සංවර්ධන ව්‍යාපෘතිවල විධායක නියෝජිතායතනය ලෙස අමාත්‍යාංශය ක්‍රියා කරන අතර ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යාම, විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. |
| **රාජ්‍ය ආයතන (SAs)** | රාජ්‍ය ආයතනවලට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ පළාත් සභා ඇතුළත් වේ. රාජ්‍ය ආයතනවල (SAs) කාර්යභාරය වන්නේ රජයේ ප්‍රමුඛතා සහ ඔවුන්ගේම ආංශික සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘතිවලට අනුකූලව අදාළ රාජ්‍ය ආයතනයේ වාර්ෂික අයවැය සකස් කිරීම සහ ජාතික අයවැය  දෙපා.(NBD) සමඟ සාකච්ඡා කිරීමයි. |
| **කැබිනට් මණ්ඩලය** | මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුව (MTMFF) වැනි ප්‍රධාන ලේඛන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. ජාතික අයවැය  දෙපා.(NBD) විසින් සකස් කරන ලද විසර්ජන පනත් කෙටුම්පත ප්‍රකාශයට පත් කිරීමට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ යුතුය. |
| **පාර්ලිමේන්තුව** | ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වේ. පාර්ලිමේන්තුවේ දින 24ක් පුරා පැවැත්වෙන විවාදය, අනුමත කර නීතිය බවට පත් කරන අවසාන ප්‍රතිපාදන නීර්ණය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. |

මූලාශ්‍රය: මුදල් අමා., පළාත් සභා නිලධාරීන් සහ රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සමඟ ප්‍රධාන තොරතුරු සපයන සම්මුඛ සාකච්ඡා | ආසියානු සංවර්ධන බැංකුව. රාජ්‍ය  මූල්‍ය කළමනාකරණ පද්ධති. 2018. | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය. 2011. මාර්ගෝපදේශයක්: අයවැය ක්‍රියාවලිය. කොළඹ | යුනිසෙෆ් අයවැය සංක්ෂිප්තය: අයවැය චක්‍රය සහ ක්‍රියාවලි. 2019

All Rights Reserved © 2023
Verité Research

# පළාත් අයවැය චක්‍රයට සම්බන්ධ ප්‍රධාන ආයතන




සටහන: මුදල් අමාත්‍යාංශය : (ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD), ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD), මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (FPD) )

Source : Key Informant Interviews with MOF ,PC officials and line ministry officials| Asian Development Bank. Public Financial Management Systems. 2018.| Ministry of Finance and Planning. 2011. A Guide: The Budget Process. Colombo| UNICEF. Budget Brief: Budget Cycle and Processes. 2019

All Rights Reserved © 2023
Verité Research

# අයවැය හා සම්බන්ධ ප්‍රධාන ලේඛන

- <u>**අයවැය කැඳවීම (Budget Call)-**</u> මුදල් අමාත්‍යාංශය විසින් රාජ්‍ය ආයතන වෙත ඔවුන්ගේ **වියදම් යෝජනා ඉල්ලා** යවන ලද ලේඛනයකි, මෙය මධ්‍ය කාලීන අයවැය රාමුවට අනුකූල විය යුතුය.
- <u>මධ්‍ය කාලීන සාර්ව මූල්‍ය රාමුව -</u> සාමාන්‍යයෙන් වසර තුනක් හෝ පහක් දක්වා විහිදෙන, නිශ්චිත කාල සීමාවක් තුළ **රජයේ මූල්‍ය ඉලක්ක, වියදම් ප්‍රමුඛතා සහ ආදායම්** ප්‍රක්ෂේපණයන් ගෙනහැර දක්වන උපාය මාර්ගික සැලසුම් මෙවලමකි.
- <u>විසර්ජන පනත් කෙටුම්පත -</u> මුදල් වර්ෂයක් තුළ නිශ්චිත අරමුණු සඳහා මහජන **මුදල් වියදම් කිරීම සඳහා රජයට බලය පවරන** ව්‍යවස්ථාදායක යෝජනාවකි.
- <u>අයවැය කතාව -</u> අයවැය කතාව යනු ඉදිරි මුදල් වර්ෂය සඳහා රජයේ යෝජිත ආදායම් සහ වියදම් සැලසුම්, ප්‍රතිපත්ති ප්‍රමුඛතා සහ ආර්ථික දැක්ම ඉදිරිපත් කරමින් **මුදල් අමාත්‍යවරයා විසින් වාර්ෂිකව පවත්වනු ලබන දේශනයකි.**
- <u>අයවැය ඇස්තමේන්තු (කෙටුම්පත)-</u> ඉදිරි මුදල් වර්ෂයේ අයවැය සඳහා යෝජනාවක් ලෙස රජය විසින් සකස් කරන ලද **මූලික ප්‍රක්ෂේපන සහ ආදායම් සහ වියදම් ප්‍රතිපාදන.**
- <u>රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව -</u> **සාර්ව දර්ශක, දේශීය සහ ගෝලීය වෙළෙඳපොළ, මූල්‍ය වර්ධනයන් සහ රජය සතු ව්‍යවසායන්හි ක්‍රියාකාරීත්වය** පිළිබඳ තොරතුරු සපයයි. බොහෝ දර්ශක සඳහා සාමාන්‍යයෙන් සෑම මුදල් වර්ෂයකම අගෝස්තු දක්වා තොරතුරු සපයනු ලැබේ. මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය උපායමාර්ගය සහ වාර්ෂික අයවැය සකස් කිරීම සඳහා භාවිතා කරන පදනම එහි තවදුරටත් අඩංගු වේ.
- <u>විසර්ජන පනත -</u> **අයවැය තුන්වන සහ අවසානවර කියවීම මත පදනම්ව එක් එක් අමාත්‍යාංශයට අදාළ අයවැය වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම** විසර්ජන පනත මඟින් සිදුකරනු ලැබේ. අදාළ වර්ෂය සඳහා රජයේ ණය ගැනීමේ සීමාව ද පනත මගින් ස්ථාපිත කෙරේ.

All Rights Reserved © 2023
Verité Research

# අයවැය හා සම්බන්ධ ප්‍රධාන ලේඛන

- **අයවැය ඇස්තමේන්තු (අනුමත)** - දෙපාර්තමේන්තුව සහ විශේෂ වියදම් ඒකකය මගින් ව්‍යාපෘති/වැඩසටහන් ප්‍රතිපාදන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සපයන **රජයේ වියදම් පිළිබඳ සවිස්තරාත්මක අනුබණ්ඩනයක්** මෙම ලේඛනය ඉදිරිපත් කරයි.
- **වසර මැද මූල්‍ය කාර්යසාධන වාර්තාව** - **අදාළ මූල්‍ය වර්ෂයේ පළමු මාස හතර සඳහා** සාර්ව දර්ශක, දේශීය සහ ගෝලීය වෙළෙඳපොළ, මූල්‍ය වර්ධනයන්, රාජ්‍ය සතු ව්‍යවසායන්හි ක්‍රියාකාරීත්වය සහ විදේශ මූල්‍යකරණය පිළිබඳ යාවත්කාලීන තොරතුරු සපයයි.
- **මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව** - සාර්ව මූල්‍ය දර්ශක, දේශීය හා ගෝලීය වෙළඳපළ, රාජ්‍ය ආදායම්, රාජ්‍ය වියදම්, මුදල් ප්‍රවාහ කළමනාකරණය, හිඟ මූල්‍යකරණය සහ ණය, රාජ්‍ය සතු ව්‍යවසායන්හි ක්‍රියාකාරීත්වය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ සංවර්ධන මූල්‍ය පිළිබඳ අදාළ **මුදල් වර්ෂය සඳහා** තොරතුරු සපයයි.
- **වාර්ෂික ජාතික විගණන වාර්තාව**- ජාතික විගණන ආයතනය විසින් හඳුනාගෙන ඇති කිසියම් අක්‍රමිකතා, අකාර්යක්ෂමතා හෝ වැඩිදියුණු කළ හැකි ක්ෂේත්‍ර ඉස්මතු කරමින් **රජයේ මූල්‍ය ප්‍රකාශන, ගනුදෙනු සහ මෙහෙයුම් පිළිබඳ විස්තීර්ණ තක්සේරුවක්** වාර්ෂික ජාතික විගණන වාර්තා මඟින් සපයයි.
- **පුරවැසි අයවැය වාර්තා (Citizen's Budget Report)**- පුරවැසි අයවැය යනු රජයේ ආදායම්, වියදම් සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳව සාමාන්‍ය ජනතාවට පැහැදිලි සහ තේරුම් ගත හැකි තොරතුරු සැපයීම සඳහා නිර්මාණය කර ඇති ජාතික අයවැයේ **සරල සහ ප්‍රවේශ විය හැකි අනුවාදයකි.**

All Rights Reserved © 2023
Verité Research

# නීතිමය රාමුව

All Rights Reserved © 2023
Verité Research

# රාජ්‍ය මූල්‍ය සම්බන්ධ ප්‍රධාන නීති

- [ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (148-153 ව්‍යවස්ථා) -] **රාජ්‍ය මූල්‍ය සඳහා බලතල සහ වගකීම් සහිත ප්‍රධාන ආයතන පිහිටුවීම** - විශේෂයෙන් "රාජ්‍ය මූල්‍ය පිළිබඳ පූර්ණ පාලනය" ඇති පාර්ලිමේන්තුවේ කාර්යභාරය නිර්වචනය කිරීම, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේදී ජනාධිපතිවරයාගේ බලතල, සහ රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ බලතල.
- [රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වගකීම් පනත (FMRA) -] **රාජ්‍ය ණය, රජයේ ඇපකර සහ අනෙකුත් මූල්‍ය නීති සඳහා ද පනත මඟින් සීමාවන් නියම කරයි.** අයවැයේ ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව, [වසර මැද මූල්‍ය තත්ත්ව වාර්තාව,] අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව සහ පූර්ව මැතිවරණ අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව වැනි ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ලේඛන ප්‍රකාශයට පත් කිරීම සඳහා කාල නියමයන් ද  සපයයි.
- [සක්‍රීය වගකීම් කළමනාකරණය -] ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ප්‍රතිපාදන සම්පාදනය කිරීම සඳහා ක්‍රියාකාරී වගකීම් කළමනාකරණයේ අරමුණ සඳහා **ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ණය රැස් කිරීමට බලය ලබා දේ.**
- [මූල්‍ය රෙගුලාසි -] මූල්‍ය රෙගුලාසි (FR) විධායකය විසින් රාජ්‍ය මූල්‍ය හැසිරීම පාලනය කරන **විස්තීරණ නීති සහ ක්‍රියා පටිපාටි මාලාවක්** ස්ථාපිත කරයි.
- **රාජ්‍ය ණය නීති සම්පාදනය -** [දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත/ලියාපදිංචි කොටස් සහ සුරැකුම්පත් ආඥාපනත/විදේශීය ණය පනත:] භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර පාලනය කරන ක්‍රියා පටිපාටි නිර්මාණය කිරීම සහ ශ්‍රී ලංකා රජය විසින් විදේශ ණය ලබාගැනීම සඳහා ප්‍රතිපාදන සලසා දෙයි.
- **ආදායම් නීති** [- රේගු ආඥාපනත, දේශීය ආදායම් පනත, සුරාබදු ආඥාපනත, මූල්‍ය පනත, වැට් පනත:] ආදායම් එකතු කිරීම සඳහා ප්‍රාථමික ව්‍යවස්ථාදායක රාමුව ස්ථාපිත කරයි (වෙනත් පනත් කිහිපයක් විවිධ ආදායම් ආකාර ස්ථාපිත කළද උදා. **විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත.**)
- [විසර්ජන පනත -] **අයවැය තුන්වන සහ අවසන්වර කියවීම මත පදනම්ව එක් එක් අමාත්‍යාංශයට අදාළ අයවැය වර්ෂය සඳහා මුදල් වෙන් කිරීම** විසර්ජන පනත මඟින් සපයයි.අදාළ වසර සඳහා රජයේ ණය ගැනීමේ සීමාව ද පනත මඟින් ස්ථාපිත කෙරේ.


All Rights Reserved © 2023
Verité Research

# අරමුදල් සැපයීමේ ප්‍රධාන මාර්ග

All Rights Reserved © 2023
Verité Research

# 2022 වර්ෂයේ රජයේ ආදායම ප්‍රමාණවත් වී ඇත්තේ රාජයේ වියදම්වලින් 45%ක් ආවරණය කිරීමට පමණි.

*රුපියල් බිලියනවලින්*




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වාර්ෂික වාර්තාව*

All Rights Reserved © 2023
Verité Research

# පළාත් සභාවලට අරමුදල් සැපයීමේ ප්‍රධාන මාර්ග

බදු ආදායම
බදු නොවන ආදායම්
විදේශ ආධාර
විදේශ ණය

මධ්‍යම රජයේ අයවැය

මධ්‍යම වියදම් නියෝජිතායතන

1. පළාත් සභා සඳහාවන මධ්‍යස්ථානයෙන් ලැබෙන ප්‍රතිපාදන
    - නියත ප්‍රතිපාදන
    - නිර්ණායක පදනම් වූ ප්‍රතිපාදන
    - පළාත් විශේෂිත සංවර්ධන ප්‍රතිපාදනය
    - ආදායම් කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ ප්‍රතිපාදන

2. පළාත් සභා සඳහා මධ්‍යම රජයෙ පැවරුම්
    - ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT): 33.33%
    - මුද්දර ගාස්තු: 100%
    - වාහන ලියාපදිංචිය: 70%

පළාත් සභා සහ පළාත් පාලන ආයතන

3. පළාත් සභා මත පැවරෙන විෂයයන්

- පළාත් සභා සඳහා ආදායම් මාර්ග 20ක් බෙදා දී ඇත.

ඉහළම විමධ්‍යගත ආදායම් මාර්ග තුනකි.

- මෝටර් රථ බලපත්‍ර ගාස්තුව,
- මුද්දර ගාස්තු
- උසාවි දඩ

සටහන: අයවැයේ නැත රාජ්‍ය නොවන විදේශීය සහ දේශීය මූලාශ්‍රවලින් අරමුදල් සැපයීම (උදා., ළමා, සමාජ ආරක්ෂණ සහ ජලය)

Source : Key Informant Interviews with MOF ,PC officials and line ministry officials| UNICEF. Budget Brief: Education sector. 2019| Study on Educational Planning and Management. National Education Commission. 2016|UNICEF. Budget Brief: WASH sector. 2021| Finance Commission recommendations 2016-2023| Finance commission annual reports 2016-2019

All Rights Reserved © 2023
Verité Research

# පළාත් සභාවලට අරමුදල් නිර්දේශ කිරීමේදී සහ වෙන් කිරීමේදී සලකා බලන කරුණු

- **පළාත් සභා මගින් කරනු ලබන අවශ්‍යතා ඇගයීම**
- **පළාත් සභා වල මධ්‍යම කාලීන සංවර්ධන සැලසුම්**

- **සමාජ ආර්ථික නිර්ණායක**
  a) පළාතේ ජනගහනය
  b) භූමි ප්‍රමාණය
  c) පළාත් අතර පවතින සමාජ ආර්ථික විෂමතා

     Example - Poverty head-count ratio, Persons per medical officer, Percentage of candidates qualified for universities in Science Stream in the Province

  a) පළාත් අතර පවතින ඒක පුද්ගල ආදායමේ වෙනස

*Capital grant is apportioned across the provinces using an index comprising of above socio-economic indicators with equal weights.*

Source : KIIs with MOF ,PC officials and FC Officials| FC recommendations 2016-2021| FC Annual Reports 2016-2019

All Rights Reserved © 2023
Verité Research

# 05. අයවැය සම්බන්ධ හඳුනාගත් ගැටලු කිහිපයක්

**ගැටලු අංක 01**

දුර්වල ඇස්තමේන්තු

**ගැටලු අංක 02**

අයවැය ලේඛනවල පවතින නොගැලපීම්

**ගැටලු අංක 3**

අයවැය පොරොන්දු ඉටු නොකිරීම


**ගැටලු අංක 4**

විනිවිදභාවය නොමැතිකම

All Rights Reserved © 2023
Verité Research

# ආදායම, වියදම සහ අයවැය ශේෂය පිළිබඳ ඇස්තමේන්තු සහ සැබෑ අගයන් අතර සැලකිය යුතු පරතරයක් වසර ගණනාවක් පුරා දක්නට ලැබේ.

අගයන් රුපියල් බිලියනවලින් දක්වා ඇත.





2019 සහ 2020 දත්ත මහ බැංකු වාර්ෂික වාර්තාවේ වාර්තා කර ඇති කරුණුවලට වඩා වෙනස් වන්නේ රජය විසින් 2019 යටතේ 2020 සඳහා වියදම් වැරදි ලෙස නිරූපණය කර ඇති බැවිනි.

**මූලාශ්‍රය: මහ බැංකු වාර්ෂික වාර්තා/අයවැය ඇස්තමේන්තු**

All Rights Reserved © 2023
Verité Research

# පසුගිය වසර 20 තුළ සැබෑ ආදායම, ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩුය.


**රජයේ ආදායම (අයවැයට එදිරිව සැබෑ), 2002-2023**




මූලාශ්‍රය: 2022 අයවැය වාර්තාවේ තත්ත්වය, වෙරිටේ රිසර්ච්

All Rights Reserved © 2023
Verité Research

# 2022 රාජ්‍ය ආදායම: සැබෑ ආදායම, ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා 31%ක් අඩුය.




ඇස්තමේන්තු සහ සැබෑ ආදයම් අතර රුපියල් බිලියන 893ක පරතරය පෙන්නුම් කරන්නේ රජය තම ආදායම නිවැරදිව තක්සේරු නොකරන බවයි.

මූලාශ්‍රය: අයවැය ඇස්තමේන්තු 2022, මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව 2022

All Rights Reserved © 2023
Verité Research

# විවිධ ලේඛනවල වාර්තා වූ අංකවල විෂමතා (2023)

අගයන් රුපියල් බිලියනවලින් දක්වා ඇත.

| | අයවැය කතාව (ඇමුණුම 1) | | අයවැය ඇස්තමේන්තුව (කෙටුම්පත) | | යෝජනා (අයවැය කතාව 2023) | වෙනස |
|---|---|---|---|---|---|---|
| ආදායම | 3,415 | - | 3,433 | | | -18 |
| වියදම | 5,819 | - | 5,854 | + | 49 | -84 |

සටහන:
අ. (2023 අයවැය කතාව) ඇමුණුම 1 හි සපයා ඇති රූපයෙන් අයවැය ඇස්තමේන්තු (කෙටුම්පත්) සහ යෝජනා වල ඒකාබද්ධ සංඛ්‍යා අඩු කිරීමෙන් වෙනස ගණනය කරන ලදී.
ආ. ආදායම සඳහා බදු ආදායම්, බදු නොවන ආදායම්, ප්‍රදාන සහ පළාත් සභා ආදායම් ඇතුළත් වේ
මූලාශ්‍රය: අයවැය කතාව සහ අයවැය ඇස්තමේන්තු 2023, 2023 අයවැය පිළිබඳ වෙරිටේ රිසර්ච් හි මහජන වාර්තාව

All Rights Reserved © 2023
Verité Research

# 2022 අතුරු අයවැය පොරොන්දු ක්‍රියාත්මක කිරීම තක්සේරු කිරීම: වෙරිටේ රිසර්ච් අවධානය යොමු කළ යෝජනා

**24** අයවැය කතාවේ සඳහන් වියදම් යෝජනා

**5** අයවැය කතාවේ සඳහන් නියාමන යෝජනා

**18** ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු රාජ්‍ය ආයතන


**50,500** රුපියල් මිලියන (නිරීක්ෂණය කළ යෝජනා වල වටිනාකම)

සටහන: : 2022 (අතුරු) අයවැය පොරොන්දු මගින් වැඩිම වියදම් යෝජනා 24 ක් සහ නියාමන යෝජනා 5 ක් නිරීක්ෂණය කරන ලදී.
මූලාශ්‍රය: රාජ්‍ය ආයතන වෙත ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය ඉල්ලීම සඳහා ප්‍රතිචාර වශයෙන් ලබාගත් තොරතුරු මත පදනම් වූ වෙරිටේ රිසර්චිහි ගණනය කිරීම්

All Rights Reserved © 2023
Verité Research

# තොරතුරු හෙළි නොකිරීම හේතුවෙන්, මුළු මුදලින් 71% ක් වන රුපියල් බිලියන 49.5 ක් වටිනා වියදම් යෝජනාවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## අයවැය පොරොන්දු 2022 (අතුරු): ප්‍රගතිය





මූලාශ්‍ර: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ ඉල්ලීම් මත පදනම් වූ තොරතුරු අදාළ අමාත්‍යාංශ වෙත ගොනු කර ඇත.
සටහන : 2022 (අතුරු) අයවැය පොරොන්දු මගින් ඉහළම වියදම් යෝජනා 24 නිරීක්ෂණය කරන ලදී.| ප්‍රතිශත යෝජනා ගණන අනුව සඳහන් කර ඇත.

All Rights Reserved © 2023
Verité Research

# ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට රාජ්‍ය ආයතන දක්වන මැලිකම, අයවැය පිළිබඳ ජනතා විශ්වාසය පළුදු වීමට ප්‍රධාන හේතුවකි.

අයවැය යෝජනාවල ප්‍රගතිය: 2017-2022




මූලාශ්‍රය: අදාළ අමාත්‍යාංශ වෙත ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීම් මත පදනම් වූ තොරතුරු.
සටහන: 2022 (අතුරු) අයවැය පොරොන්දු මගින් ඉහළම වියදම් යෝජනා 24 ක් සහ නියාමන යෝජනා 5 ක් නිරීක්ෂණය කරන ලදී.
* සාමාන්‍යය සඳහා සලකා බලන කාල සීමාව 2017 සිට 2022 දක්වා (අතුරු) කාලය වේ.

All Rights Reserved © 2023
Verité Research

# ස්ත්‍රී පුරුෂ සමජභාවයට සංවේදී අයවැයක් සැකසීමට රජය ගත ප්‍රයත්නය අසාර්ථක වී ඇත.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව තම 2018 අයවැය කැඳවීම තුළ ස්ත්‍රී පුරුශ සමාජභාවයට අනුකූල වූ අයවැයකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ත්‍රී පුරුශ සමාජභාවය මත පදනම් ප්‍රධාන කාර්‍ය සාධන දර්ශක (ප්‍ර.කා.සා.ද.) හඳුන්වා දෙන ලදී




All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුශ සමාජභාවය සඳහා වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශක- 12

| | | 2019/20 |
|---|---|---|
| 1 | ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වයේ ප්‍රතිශතය වැඩි වීම | පිරිහෙනවා |
| 2 | මූල්‍ය ආධාර වැඩසටහන් හරහා නිවාස ඉදිකර ඇති කාන්තා මූලික නිවාස සංඛ්‍යාව වැඩි වීම | හෙළිදරව් නොකළ |
| 3 | ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙන් වූ දත්ත පද්ධති පවත්වාගෙන යන රාජ්‍ය ආයතන සංඛ්‍යාව | හෙළිදරව් නොකළ |
| 4 | ජාතික වෘත්තීය සුදුසුකම ලබාගෙන තාක්ෂණික හා වෘත්තීය ක්ෂේත්‍රවල රැකියාවලට පිවිසෙන කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ යාම. | හෙළිදරව් නොකළ |
| 5 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ණය/ සහනාධාර යටතේ තිරසාර ව්‍යාවසායන්ගේ නියැළෙන කාන්තා ව්‍යවසායකයින් සංඛ්‍යාව | පිරිහෙනවා |
| 6 | ආපසු පැමිණෙන කාන්තා සංක්‍රමණිකයින් සහ ඉදිරියේදී විදෙස්ගත විය හැකි කාන්තාවන් සේවයේ යෙදවීම අරමුණු කරගත් ජාතික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම | No Progress |

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වූ ප්‍රධාන කාර්ය සාධන දර්ශක-12

| | | 2019/20 |
|---|---|---|
| 7 | ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හරහා තීරණ ගැනීමේ තනතුරුවලට පත්වූ සිටින කාන්තාවන් සංඛ්‍යාව වැඩි කිරීම | හෙළිදරව් නොකළ |
| 8 | ස්ත්‍රී පුරුෂ සමාජභාවයට හිතකර සේවා පරිසරය සහ දිවා සුරැකුම් පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇති ආයතන සංඛ්‍යාව | හෙළිදරව් නොකළ |
| 9 | ආපදාවලින් මුදවා ගැනීම, සහන සැලසීම, පුනරුත්ථාපනය කිරීම සහ නැවත ගොඩනැගීමේ අවධීන්හිදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම සහතික කිරීම සඳහා සකස් කර ඇති ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සංඛ්‍යාව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම | හෙළිදරව් නොකළ |
| 10 | කාන්තා සහ ළමා ගැටළු සංවේදීව සහ ඵලදායී ලෙස හැසිරවීමට හැකියාව ඇති පොලිස් ස්ථානවල කාන්තා හා ළමා කාර්යාංශයේ ඒකක සංඛ්‍යාව | හෙළිදරව් නොකළ |
| 11 | සංශෝධනය කරන ලද, පනවන ලද සහ/හෝ ක්‍රියාත්මක කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය වෙනස් කොට සැලකීමේ නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සංඛ්‍යාව | හෙළිදරව් නොකළ |
| 12 | ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ආමන්ත්‍රණය කිරීම සඳහා බහු ආංශික ජාතික ක්‍රියාකාරී සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය | හෙළිදරව් නොකළ |

All Rights Reserved © 2023
Verité Research


# ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳ පැහැදිලිබාවයක් නොමැතිවීම ප්‍රධාන ගැටලුවකි (2021 අයවැයෙහි උදාහරණයක්)

අයවැය යෝජනා යටතේ මුදල් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලද නව වැඩසටහන් සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් වෙන් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව (NBD) වගකිව යුතුය.

අයවැය පොරොන්දු සඳහා වගකිව යුතු රජයේ බලධාරීන් හඳුනා ගැනීම සඳහා, ජා.අ.දෙ NBD වෙත තො.දැ.අ (RTI) ඉල්ලීමක් ගොනු කරන ලදී

තො.දැ.අ(RTI) සඳහා ජා.අ.දෙ (NBD) ප්‍රතිචාරය මත පදනම්ව, RTI 33ක් අදාළ රාජ්‍ය ආයතන වෙත ගොනු කරන ලදී.

එයින් 58% ක් නිවැරදි වගකිවයුතු බලධාරියා හඳුනා ගැනීමට පෙර අවම වශයෙන් එක් වරක් මාරු කර ඇත.




සටහන: තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI)
මූලාශ්‍රය: රාජ්‍ය ආයතන වෙත ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහාවන ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ලබාගත් තොරතුරු මත පදනම් වූ වෙරිටේ රිසර්ච්හි ගණනය කිරීම්
මුදල් අමාත්‍යාංශය - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ වගකීම්

All Rights Reserved © 2023
Verité Research

ගැටලු අංක 04: අයවැය චක්‍රය පුරාම විනිවිදභාවයක් නොමැතිකම

# විවෘත අයවැය සමීක්ෂණය 2021: ශ්‍රී ලංකාවේ කාර්යසාධනය

**අයවැය ලේඛන හෙළිදරව් කිරීම (විවෘත අයවැය දර්ශකය)**

30 / 100

**අයවැය අධීක්ෂණය (ව්‍යවස්ථාදායකය සහ විගණන ආයතනය මගින්)**

57 / 100


**අයවැය ක්‍රියාවලියේදී මහජන සහභාගීත්වය**

19 / 100

**2021 වි.අ.ද (OBS) සඳහා භාවිත කළ මුළු රටවල් ගණන:120**

# වසර ගණනාවක් තිස්සේ අයවැය විනිවිදභාවය පහත වැටී ඇත

විවෘත අයවැය දර්ශකය (OBI) ලකුණු සහ ශ්‍රේණිගත කිරීම: ශ්‍රී ලංකාව




* විවෘත අයවැය දර්ශකයෙහි (OBS) හි ක්‍රමවේදය වෙනස් කිරීම - 2015

All Rights Reserved © 2023
Verité Research

# මේ තොරතුරු සිවිල් සමාජ සංවිධාන වල කටයුතු වලට ප්‍රයෝජනවත් විය හැකි ආකාර

All Rights Reserved © 2023
Verité Research

# අයවැය චක්‍රය පිළිබඳ මහජන දැනුවත්භාවය සහ සහභාගිත්වය වැඩි දියුණු කිරීම

**අයවැය සම්පාදනය**

- ක්‍රියාවලිය සහ එහි ගැටලු පිළිබඳ සංවාදයක් නිර්මාණය කිරීම
- අයවැය සැකසීමේදී ජනතා අවශ්‍යතා පිලිබඳ අදාළ ආයතන සහ මහජන නියෝජිතයන් දැනුවත් කිරීම.

**අයවැය අනුමැතිය**

- අයවැය කතාව ගැන පමණක් නොව සමස්ත අයවැය පිළිබඳ පුළුල් මහජන සංවාදය දිරිමත් කිරීම.
- අදාළ ක්ෂේත්‍ර වලට අදාළ යෝජනා සහ අරමුදල් සැපයීම පිළිබඳ ජනතා සංවාදයක් ගොඩ නැගීම

**අයවැය ක්‍රියාත්මක කිරීම**

- අයවැය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වරින් වර නිරීක්ෂණය කිරීම (වෙරිටේ රිසර්ච් හි අයවැය පොරොන්දු; COPE, COPA, DPMM සහ විගණන වාර්තා)
- අයවැය ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් අක්‍රමිකතා සහ අයථා කළමනාකරණයන් ඉස්මතු කිරීම (COPE, COPA, විගණන වාර්තා ආදිය).

**අයවැය අධීක්ෂණය**

- වසර ගණනාවක් තිස්සේ විගණන වාර්තා තුළින් ආමන්ත්‍රණය නොකළ විමසුම්/සොයාගැනීම් පිළිබඳ පසු විපරම් කිරීම.

All Rights Reserved © 2023

# ප්‍රධාන කරුණු

1 සමස්ත අයවැයෙන් කුඩා කොටසකින් පමණක් අයවැය කතාව සමන්විත වේ. වාර්ෂික අයවැයේ ප්‍රධාන කොටස් වන්නේ විසර්ජන පනත සහ අයවැය ඇස්තමේන්තු ය.

3 මාධ්‍ය විසින් අයවැය අනුමත කිරීමේ අදියර කෙරෙහි අවධානය යොමු කිරීමට නැඹුරු වන අතර, අයවැය ක්‍රියාත්මක කිරීමේ අදියර කෙරෙහිද ඊට සමානව, නොඑසේ නම්, ඊට වඩා අවධානය යොමු කිරීම වැදගත්ය.

2 අයවැය සම්පාදනයේදී මහජන සහභාගිත්වයට ඇති ඉඩ කඩ අඩුය. එසේම අදාළ ව්‍යාපෘති, යෝජනා සම්බන්ධයෙන් ඇති තොරතුරු සීමිතය. ඒ පිළිබඳ මහජන සංවාදයක් ඇති වීම වැදගත්ය.

4 එසේම අයවැය ක්‍රියාත්මක කිරීම පිළිබඳ විනිවිදභාවට සහ වගවීම අඩුය. එය වර්ධනයට නම් වඩාත් හොඳ මහජන අධීක්ෂණයක් තිබීම අත්‍යවශ්‍යය.

All Rights Reserved © 2023
Verité Research

# ස්තූතියි!

All Rights Reserved © 2023
Verité Research

# සැසිය 2: ජාතික සහ පළාත් අයවැය

## ක්‍රියාකාරකම:
## අයවැය චක්‍ර අදියර සහ අදාළ අයවැය ලේඛන හඳුනාගැනීම

ක්‍රියාකාරකම : අයවැය චක්‍රයේ අදියර සහ එක් එක් අදියරට අදළ ලේඛන  හඳුනාගැනීම.


ලැබෙන කාලය: විනාඩි 20 යි

ලබා දී ඇති කාලයෙන් පසු, සෑම කණ්ඩායමක්ම තම ෆ්ලිප්චර්ට් පෝස්ටරය ඉදිරිපත් කළ යුතුය

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවේ ජාතික අයවැය චක්‍රය

| |
|---|
| ක්‍රියාත්මක කිරීම |
| අධීක්ෂණය |
| අනුමැතිය |
| සම්පාදනය |




| |
|---|
| අයවැය කතාව |
| ජාතික අයවැය ඇමතුම (National Budget Call) |
| අයවැය ඇස්තමේන්තු (කෙටුම්පත) |
| විසර්ජන පනත් කෙටුම්පත |
| විසර්ජන පනත |
| අයවැය ඇස්තමේන්තු (අනුමත) |
| වාර්ෂික විගණන වාර්තාව |
| මූල්‍ය කළමනාකරණ වාර්තාව |
| පුරවැසි අයවැය වාර්තාව |

All Rights Reserved © 2023
Verité Research

# ශ්‍රී ලංකාවේ ජාතික අයවැය චක්‍රය

**1. සම්පාදනය**

ජාතික අයවැය ඇමතුම (National Budget Call)
විසර්ජන පනත් කෙටුම්පත

**2. අනුමැතිය**

අයවැය කතාව
අයවැය ඇස්තමේන්තු (කෙටුම්පත)
මූල්‍ය කළමනාකරණ වාර්තාව

**3. ක්‍රියාත්මක කිරීම**

විසර්ජන පනත
අයවැය ඇස්තමේන්තු (අනුමත)
පුරවැසි අයවැය වාර්තාව

**4. අධීක්ෂණය**

වාර්ෂික විගණන වාර්තාව

All Rights Reserved © 2023
Verité Research